ඔබේ අංකය
உமது இல
Your No.

මගේ අංකය
எனது இல
My No. SSD/SSS & WS

දිනය
திகதி
Date 12.12.2022

දුරකථන අංක
தொலைபேசி இல
Telephone Nos.

ෆැක්ස්
தொலைநகல்
Fax

විද්‍යුත් තැපැල
ஈ மெயில்
E mail drsspdn@gmail.com

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## பேராதனைப் பல்கலைக்கழகம், இலங்கை
## UNIVERSITY OF PERADENIYA, SRI LANKA

STUDENT SERVICES DIVISION

දයාබර සිසු දරුවනි,

ඔබ පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුල රැඳී සිටින කාලය තුල ඔබගේ සුභසාධන අවශ්‍යතා ඉලක්ක කොටගෙන මෙම වසරේදී ස්ථාපිත කරන ලද ශිෂ්‍ය සහායක සහ සුබසාධන සේවා අංශය මගින් සිදු කරන ලද ප්‍රධාන කර්තව්‍යයන් පිළිබඳව මෙමගින් ඔබව දැනුවත් කරමි.

1. **නේවාසික පහසුකම්**

<u>විජයවර්ධන ශාලාව</u>: මෙම ශාලාව සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කොට සිසුන් නේවාසික ගතකොට ඇත.

<u>අරුණාචලම් ශාලාව</u>: මෙහි පළමු මහල පූර්ණ වශයෙන් ප්‍රතිසංස්කරණය කොට සිසුන්ට නේවාසිකත්වය ලබා දී ඇති අතර එහි ඉහළ මහළ ප්‍රතිසංස්කරණය කොට 2023 පෙබරවාරි මාසය වන විට නේවාසික පහසුකම් ලබා දීමට නියමිතය.

<u>ගෘහභාණ්ඩ</u> : සරසවි මැදුර සහ මහකන්ද නේවාසිකාගාර සඳහා කටාල ඇඳන් (Bunk Beds) ඇණවුම් කොට ඇත.

2. **ආපන ශාලා** : ප්‍රධාන ආහාර වේල් වලටත් ඉන්පසු අලෙවි කරනු ලබන අනෙකුත් ආහාර වර්ග වල මිළ ගණන් පිළිබඳව ආපනශාලා හිමිකරුවන් සහ සිසුන් සමග සාකච්ඡා කොට සියලුම ආපනශාලා වල පොදු මිළ ගණන් වලට අලෙවි කිරීමට එකගතාවය ඇති කර එකග වූ මිළ දර්ශනය සියලුම ආපනශාලා වල පාරිභෝගිකයන් වෙත ප්‍රදර්ශනය කිරීම පිණිස ලබා දෙන ලදි.

විශ්වවිද්‍යාලය විසින් ආපනශාලා සඳහා, නොමිලේ විදුලිය සහ ජලය සපයා දෙමින් තව දුරටත් ආහාර වල මිළ ගණන් පහත හෙළීම පහසු කරලීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. තවද, ගෘහභාණ්ඩ සහ ආපනශාලා සඳහා අත්‍යාවශ්‍ය උපකරණ සහ මෙවලම් ලබා දීමට සිදු කර ඇත. තවද මෑත කාලයේදී ඇති වූ ගෑස් අර්බුදයට පිළියමක් ලෙස ඉල්ලීම් කරන ලද ආපනශාලා සඳහා අගුරු වලින් ක්‍රියාකරන උඳුන් සකසා දීම සිදුකර ඇත. එපමණක් නොව ජලකාන්දු සිදුවන වහල සැකසීම, කඩතොලු වූ බිත්ති සහ බිම් සැකසීම, අවශ්‍ය පරිදි බිත්ති වර්ණාලේපිත කිරීම, සුළු අලුත්වැඩියා කටයුතු සිදු කිරීම ආදිය සිදුකරන ලදි.

3. **සෞඛ්‍ය පහසුකම්**

කෝවිඩ්-19 වසංගතය: මෙම වසංගතය උත්සන්නව පැවති වකවානුවේදී විශ්වවිද්‍යාලය විසින් පහත සඳහන් වන පරිදි ක්‍රියා කරන ලදි.

- අතරමැදි සත්කාරක මධ්‍යස්ථානයේදී කෝවිඩ් වැළඳුන සිසුන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම. දැඩි රෝගී තත්ත්වයන් පෙන්නුම් කළ සිසුන් පේරාදෙණිය ශික්ෂණ රෝහලට යොමු කොට ඔවුන් කළමනාකරණය කිරීම.

- විශ්වවිද්‍යාලය තුළ නිරෝධායන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- RAT සහ PCR පරීක්ෂණ නොමිලේ සිදු කිරීම.
- කෝවිඩ් සඳහා වූ පළමු, දෙවන සහ තෙවන මාත්‍රාව සිසුන්ට ලබා දීම සඳහා එන්නත් කඳවුරු රාශියක් සංවිධානය කිරීම.

<u>වෙනත් උපකරණ සහ පහසුකම්</u>

- විශ්වවිද්‍යාලය විසින් ඉල්ලීම් ලද විට සෙංගමාලය බී, ජලභීතිකාව, පිටගැස්ම සහ වැරිසෙලාව වැනි රෝග සඳහා අවශ්‍ය එන්නත් ලබා දීම අඛණ්ඩව සිදු කිරීම සහ තවදුරටත් සිදු කරනු ඇත.
- රෝගී වන සිසුන්ට වෛද්‍ය පරීක්ෂණ පහසුකම් නොමිලේ ලබා දීම.

4. **සිසුන්ට උපදේශන සහ මනෝවෛද්‍ය සහාය ලබා දීම**

විශ්වවිද්‍යාලයේ සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් යම් ආකාරයේ බහු සාදක ආතතීන්ගෙන් පෙළෙන බව විශ්වවිද්‍යාලය විසින් හඳුනාගෙන ඇත. සිසු දිවිනසා ගැනීමේ අවදානම හා ඔවුන් පීඩනයට ලකම්ම අවම කිරීම සඳහා උපදේශන හා මනෝවෛද්‍ය සහායක ඒකකයක් ස්ථාපිත කොට උපදේශන පහසුකම් ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කොට ඇත. වෛද්‍ය පීඨයේ මනෝවෛද්‍ය අධ්‍යයන අංශය සහ ශාස්ත්‍ර පීඨයේ මනෝවිද්‍යා අධ්‍යයන අංශය කෝවිඩ්-19 වසංගතය පැවති සමයේ මනෝවිද්‍යා සහාය අවැසි සිසුන්ට විශාල සහයෝගයක් ලබා දීමට කටයුතු සංවිධානය කොට පැවතුණි.

5. **මූල්‍ය සහාය**

- රජය මගින් සපයනු ලබන මහපොළ ශිෂ්‍යත්ව 7000 කට ආසන්න ප්‍රමාණයක් සහ 1000 කට අධික ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව වලට අමතරව විශ්වවිද්‍යාලය විසින් පහත් සඳහන් සහායයන් සිසු ප්‍රජාව වෙත ලබා දෙනු ලබයි.

  අ) පීඨ මට්ටමින් සිසුන් 600 කට ශිෂ්‍යාධාර ලබා දීම.

  ආ) ආර්ථික අපහසුතා ඇති සිසුන් ආසන්න වශයෙන් 300 කට ශිෂ්‍ය සහායක රැකියාවක් ලෙස පුහුණුවක් ලබා දී ගෙවීමක් සිදු කිරීම.

  ඇ) ආර්ථික අපහසුතා සහිත සිසුන් හඳුනාගෙන ඔවුන් හට ලැප්ටොප් පරිගණක ලබා දීම.

- <u>කෙටිකාලීන මූල්‍ය සහාය ලබා දීම</u>

  රට අගුළුදමා තිබූ කාලය තුළ මූල්‍යමය සහාය ඉල්ලා සිටි ආර්ථික අපහසුතා ඇති සිසුන් සඳහා කෙටි කාලීන ශිෂ්‍යත්ව ක්‍රම කිහිපයක් පීඨ මගින් සංවිධානය කිරීම.

- තවද රට අගුළුදමා තිබූ කාලය තුල සිසුන් ඔවුන්ගේ අත්‍යාවශ්‍ය පුහුණුව සඳහා රැගෙන යාම ඒම පිණිස ප්‍රවාහන පහසුකම් පීඨයන් කිහිපයක් මගින් තමන් වෙත තිබූ පහසුකම් අනුව ලබා දීමට කටයුතු කිරීම.

6. **ආපදා අවස්ථාවලදී ලබාදෙන සහාය**

ආපදා අවස්ථා වලදී විශ්වවිද්‍යාලය මගින් හදිසි උපකාරද කරනු ලබයි. පුද්ගලික නේවාසික ස්ථානයක හටගත් ගින්නෙන් බලපෑමට ලක් වූ සිසුන් 50කට අධික සංඛ්‍යාවකට මූල්‍යමය සහ තාවකාලික නේවාසික පහසුකම් ලබා දීම මේ සඳහා දැක්විය හැකි ආසන්නතම උදාහරණයයි.

7. **සිසුන්ට ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කර ගැනීම සඳහා උපකුලපති, නියෝජ්‍ය උපකුලපති හා අනෙකුත් පරිපාලන නිලධාරීන් හමුවීමේ අවස්ථාව සලසා දී ඇත.**

මහාචාර්ය ටෙරන්ස් මධුජිත්

නියෝජ්‍ය උපකුලපති